## පන්හිඳයි පින්සලයි



සිසිර දිසානායක

# අපේ කම්

"ගම් පළාත්වල ඇවිදලා ආවට පස්සේ පණක් ආවා වගේ "

පන්හිඳ සෝදපු රෙදි වැලේ වනන්න ගත්තා. පන්හිඳයි, පින්සලයි, පැන්සලයි තුන්දෙනා නිවාඩුවට ලංකාවට ගිහින් ආවේ පෙරේදා...

"ගම්වල ගියාටත් වඩා දඹුළු ගමනයි, නුවර ගමනයි හිතටයි ඇඟටයි හොඳටම වැදුණා." පින්සල තවම ගමන් මළුවල ඇඳුම් තෝරනවා සෝදන්න. "හැමදේකටම මුල හිත" කියලා බුදු බණෙත් තියෙන්නේ ඕක තමයි."

පැන්සල වෙනම විදියකට ලංකා ගමන ගැන හිතනවා වගෙයි.

"අපි උපන්න රටේ ගහ කොළට වගේම ජීවත් වුණ අපටත් ඒ කාලගුණය, පරිසරය බද්ධ වෙලයි තියෙන්නෙ. වෙන රටක මොන තරම් හිටියත් අර මුල් පරිසරයට ගියාම අමුතු පණක් ලැබෙන්නේ හිතට විතරක් නෙවේ." පින්ගෙන් පැන්ට අභියෝගයක්.

"ඔව් ඉතින් දාඩිය ටිකක් එහෙම පිට වෙලා කොන්දට දැනෙන තැනක හවස් වෙනකොට ඇළ වුණාම ඇඟේ තියෙන අමාරුකම් කොහෙන් බැහැලා යනවද කියන්න බෑ ලංකාවෙදී" පන්ගෙන් පින්ගේ කතාවට තල්ලුවක්.

"තම තමන් උපන් පරිසරයට අනුගත වෙන්න ලේසියි කියන එකේ තර්කයක් නෑ. ඒ හින්දම ඒක ඇඟට පහසුවක් තමයි. ඒත් හිතේ සතුට තමයි ඔතන වැඩියෙන් බලපාන්නේ කියලට මට නම් හිතෙන්නෙ තමුන්ගෙ නෑයින්, හිත මිතුරන් අතරේ ගත කරපු කාලයේ හිත සතුටින් පිරුණා. ඒ සතුටට ඔය අනික් හැමදේම යටපත්." පැන් අත අරින්නේ නෑ තමුන්ගේ අදහස.

"තමන් අගය කරන දේ, ඒවායින් ලැබෙන ආඩම්බරය වගේ දේවල් අපි ගිය පෞරාණික තැන්වල තියෙනවා. පින් කැමතිනේ චිත්‍ර, පිළිම වගේ දේවල් දකින්න. ඉතින් දඹුල්ල, නුවර වගේ අපේ සිද්ධස්ථානවල ඒවා ඕන තරම්. මේ දේවල්වලින් අන්තිමට ලැබෙන්නේ හිතේ සතුට නෙවෙයි ද?"

"පැන් වුණත් කැමතියිනේ ඉතිහාසයට. මං දැක්කා අර දඹුල්ලේ රජ මහා විහාරය ගාව තියෙන සෙල් ලිපිය කියවන්න දඟලනවා. දළදා මාලිගාවේ හේවිසි අහන්න සතුටු නිසානේ පාන්දරම තේවාව බලන්න ගියේ ? මේ හැම දේකින්ම අපේ හිත්වලට දැනෙන්නේ නිරාමිස සතුටක්. ඒ සතුට අපේ ආයු වඩවනවා"

"ඇයි ඉතින් මේ දේවල් උපන් රටේ දි විතරක්?"

"අනික් රටවල්වල දේවල් දැක්කමත් සතුටක් ඇතිවෙනවා තමයි. ඒත් අපේ ය කියන හැඟීම වෙන රටවලදී දැනෙනවා අඩුයි. සමහර විට අපි ලංකාවේ දකින දේවල්වලට වඩා වටිනා, ලස්සන දේවල් දකිනවා වෙන්න පුළුවන්. තමන්ගේ ම දෙයක් දකිනවා තරමට හිතට දැනෙන්නෙ නෑ මට නම්. අපි වෙන දේශ දීපංකරවල ඇවිද්දත් අපට ඒවා ආගන්තුකයි. අපිත් ඒ රටවලට ආගන්තුකයි. ඒත් තමන්ගේ රටට, ගමට ගියාම එහෙම ද?"

"කලා නිර්මාණයක් නම් කොහේ වුණත් එකයි. ඒකේ ශිල්පීය දායකත්වය යි අගය කරන්න ඕන. "අපේ"ය කියන පටු සීමාවලින් හිතන්නේ නැතිව." පැන් තවත් තර්කයග් ගෙනාවා.
"කලා නිර්මාණයක් සංසන්දනය කරන්න බෑ. තරඟයක් නෙවෙයිනේ. එක එක හේතු උඩ ඒවායේ නිර්මාණාත්මක බව සියුම් කම්, කලාත්මක බව වගේ දේවල් වෙනස් වෙන්න පුළුවන්.
නිර්මාණය කළ කාලය, ඒ කාලයේ සමාජ ආර්ථික වටපිටාව, නිර්මාණකරුවන්ගේ දැනුවත්කම වගේ දේවල්... යුද්ධ කාලයක කලා නිර්මාණ බිහිවෙනවා අඩුයි. සීතාවක රාජධානියේ බිහිවුණ කලා නිර්මාණ අඩු ඒ නිසා. ගහ කොළ වට පිටාව ගැන වුණත් කියන්න තියෙන්නේ ඔය ටිකම තමයි." පන් උත්තර බැන්දා.

"අනික "අපේ" ය,"මගේ" ය කියන සිතුවිල්ල හොඳ නෑ නේද? දැන් බුද්ධාගමේ වුණත් කියවෙන්නේ "අපේ ය", "මගේ" ය කියන හැඟීමෙන් මිදිලා හැම දෙයක් ම අත හරින්න කියලනේ...? " පැන්ගේ තර්කයත් හරි.

"අත හරිනවනම් අපි මුලින්ම අතහරින්න ඕන අනුන්ගේ දේවල්නේ. තමන් ලොකෝත්තර ජීවිතයකට උනන්දු නම් ඊට පස්සේ තමන්ගේ කම් හිතින් අයින් කරන්න පුළුවන් ක්‍රමයෙන්. ඒත් ඒක ලේසි නෑ. තමන්ගේ දරුවෙක් දිහා අනික් අය දිහා බලන විදියට බලන එක ලේසි නෑ." පන් හිනාවුණා.

"හැබැයි ඉතින් තමන්ගේ කම හින්දා අනුන්ගේ අයට අසාධාරණයක් වෙනවනම් හොඳ නෑ. සම්මුඛ පරීක්ෂණයක දී අනික් ඉස්කෝලෙක ආදි ශිෂ්‍යයෙකුට වැඩි සුදුසුකම් තියෙද්දිත් තෝරා නොගෙන තමන්ගේ ඉස්කෝලේ ආදි ශිෂ්‍යයෙක් තනතුරකට තෝරා ගත්තොත් හොඳ නෑනේ." පින් කතාවට එකතු වෙන්නේ ඒ විදියට.

"අසාධාරණයක් විතරක් නෙවෙයි. ඒක වැරැද්දක්. වැරදි කරන්න කිසිම ඉස්කෝලෙකින්වත්, කිසිම දෙමව්පියෙක්වත් අනුබල දෙන්නෙ නෑ. ඒත් මිනිස්සු වරදට පෙළඹෙන එක තමයි ප්‍රශ්නය. හොඳට ඉගෙන ගත්ත අයට වුණත් තමන් කරන්නේ වැරැද්දක් ය කියලා තේරෙන්නෙ නෑ. තේරුණත් ආත්මාර්ථකාමීකමට ඒක සුළුවට හිතනවා." පන් හැඟීම්බරව කිව්වා.

"අන්න ඒ විදියට ආත්මාර්ථකාමී වෙන්නේ තමන්ගේ හැඟීමක් එක්ක. ඒකයි තමන්ගේ කමේ වරද. තමන්ගේ දෙයක් අගය කරන එක අපට ඕන කරන දෙයක්. නැතිනම් කොහොමද ජාතියක් විදියට ඉස්සරහට යන්නේ. ඒ හැඟීමයි, ආර්තමාර්ථකාමීකමයි දෙකක්. ඔය දෙක පටලවාගන්නේ නැති නම් තමයි හොඳ"



පන්ගේ කතාවට පැන්, පින් දෙන්නත් එකඟයි වගේ...